

# වම් ඉවුරේ මිනිස්සු

රාජාංගනේ මතක සටහන්

**මං උඹේ පුසුඹ හඳුන්පොතේ හිර කරාගෙන තීන්දු ගමන යන්ට වෙනකං බලා ඉන්නවා අයියණ්ඩි..**

දහවල් සප්පායමෙන් පසුව ගමේ එකාලා ගෙනැවිත් තිබූ පලවැල වල රස බලමින් මලිත්තිත් මාත් වෑ කණ්ඩිය දිගේ ඇවිදගෙන ගියේ දෙදෙනාගේ හුරු පුරුදු සෙවණ වූ කුඹුක් ගස යටටය. කුඹුක් සෙවණේ වාඩි වී දොඩමළු වූ මලිත්ති හිටිවනම මගේ කන් හොරොව්වට දිගේලි කළ පද පේලිය ජීවිතය පටන් ගන්නේ කෙළෙසද කියන ගැටළුවට මා මැදි කළේ ය.

*නවදැලි හේනේ කුරහන් කැති ගා — ගන්ට*
*ලව දෙව නැතිව පැල පිල දොක්කන් — යන්ට*
*ඉව ඇල්ලුවට මා අවඩි කොර — ගන්ට*
*නව රියනක අටුව ඕනෙලු මං — ගන්ට*

මොකෑ නගා උඹ එහෙම කිව්වෙ?

මේ අහ අයියණ්ඩි.. උඹ නවදැලි හේනක් හරි කොරලා කුරහන් කපා ගන්ට සාංකාවක් නැතුව මං උඹේ පැලට එක්කන් යන්ට ඒ වගේම මං උඹේ අවඩි කොරගන්ට නං උඹ නව රියනක අටුවක් තනා කොරාන පෙන්නන්ට ඕනෑ.. ඒක කැළෑ ගං කරේ එකාලගෙ චාලිත්තරේ... මගෙ දෙයියෝ උඹේ පැල පිලට පදියං වෙනතුරු මං ඉන්නෙ ඉහිලුම් බිහිලුම් නැතුව.. ඒ හින්දා නවරියනක අටුවක් තනා කොරාන විගැහින් මං උඹේ පැලට දොක්කාගනින් අයියණ්ඩි..

නගා.. මං හේන් කෙරුවාව දන්නැතුවා.. ඉතින් කොහොමෙයි නගා මං අටුවක් තනන්නෙ..? මං දන්නවා උඹලගෙ වරිග පෑහුමට මං ළං කරගන්ට බෑ කියලා..

ඕං අයියණ්ඩි උඹ තව එකක් කියැව්වා.. මම නොවැ දළදා රටේ වරිග පෑහුමට ගැලපෙන්නෙ නැතුව.. එහෙව් එකේ උඹලගෙ මහ එව්වො ගෙඩි මාල දාපු මැණිකෙ කෙනෙක් සහේට පංගරාතු කරයි උඹට... එදාට මං මොකැ කරන්නෙ? අත පය වාරු හිඳුන අම්මයි අප්පොච්චගෙයි සුමේ කරාගෙන තනි පංගලමේ උඹේ පුසුඹ හඳුන්පොතේ හිර කරාගෙන තීන්දු ගමන යන්ට වෙනකං බලා ඉන්නවා.. මං උඹ එක්ක තරහා ගන්නෑ අයියණ්ඩි..

අඩා මලයා මෙහාට වරෙං.. මේ පැණි කජු ගිලලා දළදා රටෙන් ගෙනාව තේ බොන්ට සූජානං.. විගැහින් වරෙන් ඇල්වෙන්ට කලියෙන්..

යම නගා යම.. අන්න ගෝඹිරා අයියා කෑගහනවා..

මලී මා සමග පා තබමින් එළිමහනේ තේ බීමට සූදානම් කළ තැනට ළං වුණා..

පුච්චපු කජු වලට මී පැණි දාලා ගල් කරලා.. පුදුම රසක් පැණි කජු.. දළදා රටේ තේ සමග .. බෙලිමල් රණවරා ඉරමුසු හැමදාම බොන කැලෑගමේ අය මා ගෙන එන උඩරට තේ වලට හරි මනාපයි.. පොල්කටුව පුරවාගෙන බොන ගමන් "පුසුඹයි" කියන්නෙ හරි සතුටින්.

බෝගල




***ඇය ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ රෝහලක සේවය කරන තරුණ වෛද්‍යවරියකි....***
***මේ ඇගේ සායනික සටහන් නොවේ...***
***ජීවන සටහන් ය...***

ඇස් හිස් මොළ නැති පිසාචයන් මැද... සුළු වේලාවකට ඇහැ පියවගන්නට හිතුවත් අවශ්‍ය පරීක්ෂණයක විස්තර ලැබී ඇතැයි වාට්ටුවෙන් ලැබුනු දුරකථන ඇමතුම නිසා ආයෙත් වාට්ටුවට යන්න වුනා. පෙරදින තෝංචියක් නැතුව කියවනවා.

"අම්මා , මෙයාට ප්‍රශ්ණයක් නැද්ද ?" ඇය මගෙන් අහනවා. දෙමළ මිනිස්සු ගෞරවයෙන් කතා කරද්දී අපට "අම්මා" යැයි

# ළමා මව්වරුන්ගේ බෙදවාචකය

යටිබඩේ කැක්කුමක් නිසා රෝහල් ගත වුනු 15 හැවිරිදි මවකගේ පරීක්ෂණ වාර්ථා පිරික්සා ඇයගේ තත්වය යහපත් හෙයින් ඇයව ගෙදර යැවිය හැකි බවයි අප වෛද්‍යතුමාගේ අදහස වුනේ. ඩිස්චාජ් කරන්න හෙවත් ටිකට් කපන්න නම් නේවාසික දොස්තර/හවුස් ඔෆිසර් අනිවාර්යයෙන් අදාල පත්‍රිකා පුරවා, රෝහල් ගත වුන කාලය ඇතුලත කරන ලද ප්‍රතිකාර සහ පරීක්ෂණ එම මවගේ මාතෘ කාඩ් පතේ සටහන් කළ යුතුයි.

මා ඉහත සඳහන් කළ අම්මා අවුරුදු 15 දරුවෙක්. ඇගේ දුක්බදායි කතාපුවත මුල සිට දන්නා නිසා ඇය දකින හැම වාරයකම මගේ හිත ඇතුලේ මහා දුකක් දැනෙනවා. පොත පත පාඩමෙන් , සෙල්ලමෙන් කල් ගත කළ යුතු වයසේ පසුවන ඇයට මෙවැනි ශෝකජනක ඉරණමක් උරුම වීම පූරුවේ කළ කර්මයක් මැයි.

ලේ පරීක්ෂණ මූත්‍රා පරීක්ෂණ ආදී සියල්ල සාමාන්‍ය අගයන්හි පැවතුන නිසා මම ඒ මවගේ සායන ටිකට් පතේ ඒවා සඳහන් කරමින් ඉන්නා අතරේ ඈ බලා ගන්නා ඇගේ නැන්දනිය පැමිණ මා සමග කථා කරන්නට විය.

"ඩොක්ටර් , බබා කොහොමද ?" ඇය ඇසුවා.
"ප්‍රශ්නයක් නෑ අම්මා බබා හොඳින්. මේ දරුවත් හොඳින්. දැන් කොහොමද මේ අම්මාගේ ගෙදර තත්වය?" මම විමසුවා.
"මම මෙයාගේ නැන්දා... මටත් දරුවෝ ඉන්නවා. ඒත් අපි මෙයාව බලාගන්නවා."
"එතකොට මේ ලැබෙන දරුවා ?" මම විමසුවා.

"අපි අපේ නම් දීලා එයාවත් හදාගන්නවා. බටද වලින් මේ දරුවා ඉල්ලුවා ඒත් ඒ නිවාසෙට යැවුවොත් මෙයාට මොනවා වෙයිද දන්නේ නෑනේ" ඇය තොර

අමතනවා, මුලදී නම් අපිට හිතාගන්නවත් බැරි වුනා ඇයි මේ කියලා නමුත් පසුව අපේ නර්ස් මිස්ලාගෙන් අසා දැනගත්තා ඒක විශේෂ ගෞරව පදයක් බව.

අවුරුදු 15 දරුවෙක්ට දරුවෙක් ඉපදීම සමහර විට පුදුමයක් නොවන්නට පුලුවන්.ඒත් මේ දරුවාගේ කුස තුල සිටින දරුවාගේ පියා ඇගේ පියායි. මව නොමැති මේ දරුවන් හට කෑම බීම පවා ලැබෙන්නේ



ඉඳ හිට නෑ ගෙවල් වලිනි.

අරක්කු මත්පැන් බී කාලය ගතකරන ,එයින්

සිහි විකල්ව තම ලෙයින් උපන් දරුවා විනාශ කළ මේ පියා තම දරුවාගේ කුසෙහි දරුවෙක් ඇති බව දැනගත් දා සිය දිවි තොර කර ගත්තේය. දැන් මේ දරුවන් රැක බලා ගන්නේ නෑ හිතවතුන් විසිනි. ලෝකයක් තනන මිනිසුන්ම ඒ ලොව විනාශ කරන අයුරු දුටුවිට හිතට ඇතිවන්නේ කණස්සල්ලක්. අපේ ලොවේ අනාගතේ මේ මල් වැනි පුංචි දරුවන් ය.

***නිසි අධ්‍යාපනයක් ලබා සුරක්ෂිතව ඇතිදැඩි වෙන්නට සෑම දරුවෙක්ටම අයිතියක් තිබිය යුතුයි.***

දරුවන්ට නිසි කළ නිසි අධියාපනයක් ලැබිය යුතුයි. මේ කුඩා දරුවා පාසැල් ගොස් නැත ඒ වෙනුවට කුඩා කළ සිටම ඇයට සිදුවුනේ ගේ දොර වැඩ කටයුතු කිරීමටය. ලොව පවතින හොඳ හා නරක යන මේ දෙක කුඩා කළ සිටම කියා දිය යුතුයි. සමාජයේ තිබෙන නරක අවැඩ ගැන මනා අවබෝදයක් ලැබිය යුතුය. මෙහි ඇති ශෝකජනක දෙය නම් ගුරුහරුකම් දී හදා වඩා ගත යුතු පියා විසින්ම ඇගේ ලෝකය විනාශ කිරීමය.

මේ ළමා මව දකින හැම මොහොතෙම මගේ හිත හරඩා වැටෙනවා. විඩාබර දෑසින් ඈත බලා සිටින ඇගේ හිස් බැල්ම දකින හැම මොහොතකම මට මගේ ළමාවිය මතකයට නැගෙනවා... අපි කෙතරම් නිදහසේ කෙළිදලෙන් කාලය ගත කලාද ?

නිසි අධ්‍යාපනයක් ලබා සුරක්ෂිතව ඇතිදැඩි වෙන්නට සෑම දරුවෙක්ටම අයිතියක් තිබිය යුතුයි. මේ මෙවැන්නක් සිදුවූ ප්‍රථම වතාව නොවේ... අවසාන වතාවද මෙය නොවන බව අපි අත්දැකීමෙන් දනිමු මන්ද අප සායනය වෙත මෙවැනි ළමා මව්වරු කිහිප දෙනෙක්ම පැමිණෙන හෙයිනි.

From page 19

embarrassing exception. In fact, if one could successfully deceive people consistently and achieve financial objectives and prosperity, others look up to them with pride. The fact that such vermin are beneath contempt, by traditional standards of ethics and morality is ignored or overlooked. The Buddhist concepts of the noble eight-fold path "samma kammantha, samma waayaama" in practice by their kith and kin are looked down upon as stupidity and naivety, or a simple lack of opportunistic wisdom, not worthy of credit.
In those days, people who drove vehicles had respect for others, allowed the person on the right the right of way, did not use expletives as the norm, to drive others out of their path, and certainly did not drive on the wrong side of the road, expecting oncoming traffic to slow-down and allow them to pass whatever vehicle they were overtaking (often simply for the sake of overtaking, rather than for any advantage it offered, in cutting down travel time). Pedestrians were never expected to remove themselves to the roadside drain or gutter to avoid being run down. How has self-discipline and the supremacy of the law been overtaken by might, size of vehicle and aggression? Who do people look up to, for direction and example?

Death has become commonplace and acceptable with resignation and a shrug. To see a freshly dead person on the street does not necessarily attract crowds. On the contrary, people actively leave that area and avoid the body. By the same token, if someone is dying or seriously ill in a public place, is there a responsibility of citizens to help the person? Death seems preferable to many, but only as a state of being, rather than actually having to undergo the process, as their personal circumstances become unbearable or grossly unsatisfactory.

There was a time many years ago, when the word "Cancer" was mentioned, it sent shivers down the spine, and people only whispered it in hushed tones on the rare occasion that it touched someone's life.

Notwithstanding that back then, we knew very little about the disease, what caused it, how it could be prevented with screening, and its progress slowed down with proper lifestyle decisions, there is an extraordinary situation in Sri Lanka. Cancer is at almost epidemic levels, with some reporting that it afflicts one in five persons. People mention how little children regularly die of it; adults dying of it after a short battle, with hospitals sending patients back home saying they cannot be kept in hospital anymore.

Some years ago, scientists and agricultural researchers had established beyond doubt, that chemical fertilisers, weedicides and insecticides as residual carcinogenic substances in fruit and vegetables were a primary cause of nephritis and acute kidney failure and an array of cancers of the stomach, liver and colon and associated blood disorders. The addition of "carbide" to accelerate the ripening process of fruits, the spraying of deadly chemicals soon before harvesting cabbages, carrots, leeks, beans and even "mallum" leafy vegetables spell death to an alarming number of innocent civilians whose choices are severely limited by circumstances. Many are the "middle class" who become victims to this insidious killer. The gross insensitivity and studiedly callous attitude of those in authority is remarkable.

I have my doubts if many ordinary people will live to see the miracle of Asia becoming a reality. Life expectancy has fallen from several generations ago. Nutrition levels are lower than before. People are smaller-made than several generations earlier. The stray-dog population is estimated to be a record three million now. Perhaps their lifestyle has made them more immune to environmental hazards. We will wait on experts to make such an announcement before it can be actively promoted as an alternative…..

■